# නස්රුද්දීන්



## 1. නස්රුදින්ගේ "පණ"

නස්රුදින් එයාගෙ බිරිඳට පිස්සුවෙන් වගේ ආදරේ කළා. කොච්චරද කියනවා නම් ඔහු ඇයට කීවේ "මගේ පණ" කියලා.

දවසක් රෑ මරණයේ දූතයා යම ලෝකයේ ඉඳන් නස්රුදින්ව ගෙනියන්න ආවා. "මම ආවෙ නුඹේ පණ අරන් යන්නයි...!" යමයා කිවුවා.

එතකොට, නස්රුදින් අනික් ඇලයට හැරිලා එයාගෙ බිරිඳව ඇහැරවමින් මෙහෙම කෑ ගැහුවා.

"ඒයි නැගිටිනවා... මෙන්න ඔහේව අරන් යන්න කවුද ඇවිත්....!"

## 2. නස්රුදින් නැමැති බේගල්කාරයා

පුරපති- ඒයි නස්රුදින් තමුසෙ හරි ප්‍රසිද්ධයිලු නේද බොරු කියන්න? හා එහෙනම් මටත් බොරුවක් කියනවා බලන්න. හිත හිතා ඉන්නැතුව උණු උණු බොරුවක් කිවුවොත් මං තමුසෙට ඩොලර් පණහක් දෙනවා.

නස්රුදින්- අෑ? ඩොලර් පණහක්? ඇයි දැං චුට්ටකට කලින් පොරොන්දු වුණේ ඩොලර් සීයක් නේද?

## 3. බැල්ලිගෙ පුතා

දවසක් නස්රුදින් ගමනක් යද්දි, ඇවිදලා ඇවිදලා මහන්සිය නිසා ගලක් උඩට වෙලා ඉන්න ගමන් නිකමට "බැල්ලිගෙ පුතෝ" කියලා කෑ ගැහුවා.

කරුමෙට, ඒ වෙලාවෙම, එතන පහු කරගෙන ගිය මිනිහෙක් හිතුවා නස්රුදින් ඒ කෑ ගැහුවෙ තමුනෙ"ටයි කියලා. ඉතින් ඒ මිනිහා හොඳටම කේන්ති ගිහින් නස්රුදින්ව උසාවියට අරන් ගියා.

නඩුව අහපු නඩුකාරයා අර මිනිහට කරපු අපහාසයට වන්දි වශයෙන් ඩොලර් පහක් ගෙවන්න කියලා නස්රුදින්ට නියෝග කළා. නස්රුදින් ඩොලර් දහයක් නඩුකාරයට දුන්නා. නඩුකාරයා ඉතුරු සල්ලි දෙන්න සල්ලි මාරු කරන්න එහාට මෙහාට දඟලද්දි නස්රුදින් නඩුකාරයගෙන් මෙහෙම ඇහුවා.

"කාට හරි සාප කළොත් දඩ ගහන්නෙ ඩොලර් පහයි නේද?"

"ඔව්."

"එහෙනම්, ඉතුරු දෙන්න ඕනෙ නෑ, ඒ ඩොලර් පහ උඹ ම තියා ගනිං බැල්ලිගෙ පුතෝ."

## 4. භක්තිමත්ම රැවුලා

දිනක්, නගරයේ පූජකයා මිනිසුන් පිරිසකට දේශනා කරමින් හිටියා.

"භක්තිමත් මිනිසුන්ට රැවුල තියනවා."ඔහු කෑ ගසා කිවුවා. "හොඳ ඝන රැවුලක් කියන්නේ පාරිශුද්ධභාවය බාහිරට ප්‍රකාශමාන වීමක්."

"මේ නගරයේ කාටත් වඩා හොඳ ඝනකම්ම රැවුල තියෙන්නෙ මගෙ එළුවට."නස්රුදින් කට ඇරියා. "ඔබතුමා කියන්නේ අපි හැමෝටම වඩා භක්තිවන්තයා එළුවා කියලද?"

## 5. මම නිදි!

නස්රුදින් ඇස් දෙක පියාගෙන කවිච්චියක ඇල වෙලා හිටියා.

එයාගෙ මස්සිනා ඇවිත් ඇහුවා "ඔහේ නිදිද නස්රුදින්?"

"ඇයි මොකටද අහන්නෙ?" නස්රුදින් ඇහුවා.

"මං මේ බැලුවෙ ඔහේගෙන් ඩොලර් තුන්සීයක් ණයට ඉල්ල ගන්න පුළුවන්ද කියලා..." මස්සිනා කිවුවා.

"හොඳයි...." නස්රුදින් මෙහෙම කිවුවා; "අපි යමු අර මුලින් ඔහේ අහපු ප්‍රශ්ණයට- 'මම නිදිද?' උත්තරය; 'ඔව් මම නිදි...!' යනවා යන්න මෙතනින් මට ඉන්න දීලා."

## 6. තුන් නිවුන්නු

ගැබ්බරව උන්නු නස්රුදින්ගෙ බිරිඳගෙ ප්‍රසූති දිනය ළඟා වෙමින් තිබුනා.

දවසක් දෙන්නම නිදියන් ඉන්න වෙලාවක බිරිඳ නස්රුදින්ව හොලවලා මෙහෙම කිවුවා.

"නස්රුදින් බබා එනවා...!"

ඒක අහපු නස්රුදින් ඉක්මනින් ඉටිපන්දමක් දල්වලා අලුත් බබා එළියට එන විදිහ බලන් හිටියා.

ඒත්, විනාඩි ගාණක් ඇතුළත නස්රුදින් බලාගෙන ඉද්දිම මෙන්න බොලේ තවත් බබෙක් එළියට ආවා. එයිනුත් විනාඩි ගාණක් ගියාම, ඔන්න තවත් බබෙක්; තුන්වෙනි බබා- එළියට ආවා.

තුන්වැනියා ආව ගමන් ම නස්රුදින් හදිසියෙන් වගේ ඉටිපන්දම කටින් පිඹලා නිවලා දැම්මා.

"මොකද්ද මනුස්සයො ඒ කළේ?"බිරිඳ ඇහුවා.

"මේකයි" නස්රුදින් කිවුවා; "ඔය ඉටිපන්දම් එළිය තියෙද්දි එක බබෙක් ආවා. ඊගාවට තවත් බබෙක්. ඊටත් පස්සෙ තවත් බබෙක්. ඇයි යකෝ ඔය ඉටිපන්දම දිගටම පත්තු කරං උන්නා නම් තව කී දෙනෙක් ඒවිද කවුද දන්නෙ"

***Rodney Ohebsion - "200+ Mulla Nasrudin Stories and Jokes" කෘතියෙන් පරිවර්තනය සුරත්***

www.boondi.lk

---

කියවන මුද්දර

# සර්වජන ඡන්දයට 85 යි

## මැතිවරණ දෙපාර්තුමේන්තුවට 60 යි

ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ වයස අවුරුදු 21 සම්පූර්ණ කල ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයටම ඡන්ද දායකයින් ලෙස ලියාපදිංචි කිරීම ආරම්භ වූයේ 1931 වසරේ අගෝස්තු මාසයේ සිටය. වැඩිහිටි සර්වජන ඡන්දබලය හිමි වූ ආසියාවේ ප්‍රථම රට ශ්‍රී ලංකාවයි. සර්වජන ඡන්ද බලය ක්‍රියාත්මක කරමින් ලංකාවාසීන් විසින් රාජ්‍ය මන්ත්‍රන සභාවට ස්වකීය නියෝජිතයන් මැතිවරණ කොට්ඨාෂ මට්ටමින් තෝරා ගනු ලැබිනි. රාජ්‍ය මන්ත්‍රන සභාව සඳහා 1936 පැවැත් වූ දෙවන මැතිවරණයෙන් පසු ලෝක යුධ තත්වය වර්ධනය වු බැවින් සභාවේ කාලය වසර 6 කින් දීර්ඝ කලේය. මේ අතර 1944 දී දීවයිනට පැමිණි සෝල්බරි කොමිසම මගින් නව ආණ්ඩුක්‍රමයක් හඳුන්වාදෙනු ලැබීය.

ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීම හා පාර්ලිමේන්තු මැතිවරණ පැවැත්වීමට අදාලව නීති සම්පාදනය කරමින් 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ්‍ය සභා ආඥාව 1946 සැප්තැම්බර් 26 දින බලාත්මක කරන ලදි. 1946 පළාත් පාලන අඥාපනත හදුන්වාදෙනු ලැබීය. 1946 වර්ෂයේ සිට 1955 වර්ෂය දක්වාම ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීම හා පාර්ලිමේන්තු මැතිවරණ පැවැත්වීම සඳහා කොමසාරිස් වරයෙකු යටතේ පාර්ලිමේන්තු මැතිවරණ දොපාර්තුමේන්තුවද, පළාත් පාලන ඡන්ද වීමසීම සදහා තවත් කොමසාරිස් වරයෙකු යටතේ පළාත් පාලන ඡන්ද විමසීමේ දෙපාර්තුමේන්තුව ද පවත්වාගෙන යන ලදි. 1955 ඔක්තෝබර් මස 01 වැනිදා එකි දෙපාර්තුමේන්තු ඒකාබද්ධ කොට මැතිවරණ දෙපාර්තුමේන්තුව පිහිටුවීය.

1947 ප්‍රථම පාර්ලිමේන්තු මැතිවරණයේ සිට 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව, 1978 දෙවන ජනරජ ව්‍යාවස්ථාව අනුව මැතිවරණ ක්‍රමයේ වෙනස්කම් සිදු විය. 2001 ඔක්තෝබර් 3 වැනිදා මැතිවරණ කොමිෂන් සභාවක් පත්කල හැකිවන පරිධි 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සිදු කරන ලදි. 17 වන සහ 18 වන සංශෝධනයන් පසුකරමින් 2015 මැයි මස 15 වැනිදා සිට සම්මත 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව මැතිවරණ කොමිෂන් සභාව ස්ථාපිත කල යුතුව තිබේ.

මැතිවරණ කොමිසම පිහිටුවනතෙක් ඒ වනවිට සේවයේ නියුතු කොමසාරිස් වරයා කොමිෂන් සභාවේ බලතල ක්‍රියාත්මක කලයුතු ය.
ශ්‍රී ලංකාවේ මැතිවරණ ඉතිහාසයේ වඩාත්ම කථාබහට ලක්වූ මැතිවරණ කොමසාරිස් වරයා වන වත්මන් කොමසාරිස් මහින්ද දේශප්‍රිය මහතා තීරණාත්මක ජනාධිපතිවරණයක් (2015.01.08) සහ මහ මැතිවරණයක් (2015.08.17) ඉතාමත් ප්‍රශස්ත අයුරින් පවත්වා පොදුජන ප්‍රසාදය හිමිකරගෙන සිටි. 1983 ජූලි 01 වැනිදා සහකාර මැතිවරණ කොමසාරිස් වරයෙකු වශයෙන් මැතිවරණ දොපාර්තුමේන්තුවේ සේවයට එක් වූ දේශප්‍රිය මහතා එතැන් සිට අඛණ්ඩව දෙපාර්තුමේන්තුවේ සේවය කොට දෙපාර්තුමේන්තු ප්‍රධානියා බවට පත් වූ ප්‍රථමයා ලෙස ඉතිහාස ගතවිය. මහින්ද දේශප්‍රිය මහතා දකුණු ලක කීර්තිමත් ශාස්ත්‍රාලයක් වූ අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයේ ආදි සිසුවෙකි.

මැතිවරණ දෙපාර්තුමේන්තුවේ 60 වැනි සංවත්සරය නිමිතිකොට වටිනාකම රු.10,15,25,35 බැගින් වූ නව තැපැල් මුද්දර 4ක් මුල් දින කවරයක් සහ සමරු පත්‍රිකාවක් 2015 සැප්තැම්බර් 30 දින බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රන ශාලාවේදි ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් එළි දැක්වුණි.

www.facebook.com/කියවන-මුද්දර-kiyawana-muddara-104168856594430/

